# <u>නිවන් පාරමිතා ප්‍රාර්ථනාව</u>

අසරණ සත්වයන් සසර සයුරෙන් ගොඩ නගා මොක්පුර පිහිටවන්නාවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මම සරණ යෙමි.

මම ඒ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක වෙමි.

ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ සිරිපා යුවළ අත්‍යාදර ගෞරවයෙන් නමදිමි.

ඒ බුදුරජාණන් වහන්සේ විසින් වදාළ සත්වයන් සසර කතරින් එතර කරවන්නා වූ ශ්‍රී සද්ධර්මය ද මම සරණ යෙමි.

ඒ නෛර්යාණික ධර්මය සේවනය කරන්නා වූ ද ප්‍රකාශ කරන්නා වූ ද භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ රත්නය ද සරණ යෙමි.

මෙසේ අති උත්තම බුද්ධාදී රත්නත්‍රයට බැතියෙන් නැමදීම වශයෙන් රැස්කළ කුශල බලයෙන්,

මා හට කල්‍යාණ මිත්‍ර ඇසුර ලැබේවා!
වහ වහා නිවන් මග විවර වේවා!
නිවන් මගට ඇති බාධා දුරු වේවා!
සඟමොක් මග වසන කාමඡ්ඡන්ද ආදී නිවරණයෝ මා කෙරෙන් බැහැර වෙත්වා!
මාගේ සිත සමාධි ගත වේවා!
මගේ සිහි නුවණ දියුණු තියුණු වේවා!
දුක්ඛ සමුදය නිරෝධ මාර්ග චතුරාර්ය සත්‍ය ධර්මය මා හට අවබෝධ වේවා!
නිවන් පුරයට වහා පැමිණිය හැකි වේවා!

**සාදූ!.. සාදූ!.. සාදූ!..**

(රේරුකානේ චන්දවිමල ස්වාමින් වහන්සේගේ ග්‍රන්ථ ඇසුරින් සකස් කරන ලදී)

(බුදු කුටිය ළඟ තබාගෙන ප්‍රාර්ථනාව කරන්න)